# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1767/1 - 2012 ජූලි මස 16 වැනි සඳුදා - 2012.07.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

**පඩි පාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**ගල්කොරි සහ කළුගල් කැඩීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

ගල්කොරි සහ කළුගල් කැඩීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සේව්‍ය නියෝජිත සාමාජිකයෙකු වශයෙන් සිටි ඩී. එස්. ඩබ්. විජේරත්න මයා වෙනුවට පඩිපාලක සභා ආඥාපනතේ (136 වැනි අධිකාරය) 09 වැනි වගන්තිය යටතේ ගරු කම්කරු සහ කම්කරු සබඳතා ඇමතිතුමා විසින් සේව්‍ය නියෝජිතයකු ලෙස අංජලී විජේසිංහ මිය පත්කළ බව එකී ආඥාපනතේ 30 වැනි නියෝගය යටතේ නිවේදනය කරනු ලැබේ. මෙම පත් කිරීම 2013.08.15 දක්වා වූ කාලය සඳහා පමණි.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
ලේකම්,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය.

2012 ජූලි මස 12 වැනි දින,
කොළඹ 05,
කම්කරු මහලේකම් කාර්යාලයේ දී ය.

07-12


1A - G 016317 — 365 (2012/07)


*සැ. යු.- අති විශේෂ ගැසට් අංක 1766/1 කාණ්ඩය අංක 1766/37 න් අවසන් වේ.*

## ගැසට් කරන ලද සාමූහික ගිවිසුමේ සාමූහික ගිවිසුම් අංකය වෙනස් කිරීම සඳහා

**අංක 1717/39 දරන 2011.08.04 දිනැති ගැසට් පත්‍රය හා බැඳේ**

එම ගැසට් පත්‍රයේ පළ කරන ලද "නෙස්ලේ ලංකා පුද්ගලික සමාගම-කොළඹ ප්‍රධාන කාර්යාලය" හා "සමස්ත ලංකා වෙළඳ හා කර්මාන්ත කම්කරු සංගමය" අතර සාමූහික ගිවිසුමත්, "නෙස්ලේ ලංකා පුද්ගලික සමාගම - කුරුණෑගල කාර්යාලය" හා "සමස්ත ලංකා වෙළඳ හා කර්මාන්ත කම්කරු සංගමය" අතර සාමූහික ගිවිසුමත් ලෙස සාමූහික ගිවිසුම් දෙකක් ඇති අතර, ගැසට් පත්‍රයේ මෙම සාමූහික ගිවිසුම් දෙකෙහිම සාමූහික ගිවිසුම් අංකය 2011 අංක 09 ලෙස මුද්‍රණය කර ඇත. එහෙත් කොළඹ ප්‍රධාන කාර්යාලය සඳහා වූ සාමූහික ගිවිසුම 2011 අංක 10 දරන සාමූහික ගිවිසුම ලෙස නිවැරදි විය යුතුය.

ඒ අනුව "නෙස්ලේ ලංකා පුද්ගලික සමාගම - කොළඹ ප්‍රධාන කාර්යාලය" හා "සමස්ත ලංකා වෙළඳ හා කර්මාන්ත කම්කරු සංගමය" අතර සාමූහික ගිවිසුම 2011 අංක 10 දරන සාමූහික ගිවිසුම ලෙස නිවැරදි කර එවන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මෙයට - විශ්වාසී

කේ. ඩී. මනෝජ් ප්‍රියන්ත,
කම්කරු කොමසාරිස්,
(කාර්මික සම්බන්ධතා)
කම්කරු කොමසාරිස් ජනරාල් වෙනුවට.

08-13

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.